ET/SSS/2022(2023)/OL/61/S/Q/S-3

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Geography

# භූගෝල විද්‍යාව



**Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

Nenasa
The National e-learning Portal for The General Education

දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 61 | S | I, II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

| | |
|---|---|
| **භූගෝල විද්‍යාව** | **I, II** |
| **புவியியல்** | **I, II** |
| **Geography** | **I, II** |

*පැය තුනයි.*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

## භූගෝල විද්‍යාව I

**සැලකිය යුතුයි:**

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40කින්** සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූල ව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- **අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01. ......................................... ලෝකයේ ගැඹුරු ම සාගරික ආගාධය යි. (මින්ඩනාඕ / මරියානා / කුරිල්)

02. ප්‍රාවරණයේ සිට කිලෝමීටර් ......................................... ක් පමණ ගැඹුරට පිටත හරය විහිදේ. (1220 / 2250 / 2900)

03. වාර්ෂික වර්ෂාපතනය 250mm - 300mm අතර පවතින තුහින හා හිම පතනය වීම .................................. දේශගුණ කලාපයේ විශේෂ ලක්ෂණ වේ. (ශීත / තුන්ද්‍රා / සෞම්‍ය)

04. අප්‍රිකාවේ ......................................... ඩෙල්ටාව ආසියාවෙන් බැහැර ව වී වගා කරන ප්‍රදේශයකි. (නයිජර් / කොංගෝ / නයිල්)

05. ලෝම් ලැටරයිට් පස වඩාත් යෝග්‍ය වන්නේ ......................................... වගාවට ය. (තේ / රබර් / පොල්)

- **අංක 6 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

07. 06. ඛනිජ සම්පත් ලබා ගැනීමට භූමියේ සිදු කරන කැණීම් භූමි හායනයට හේතු වේ. නි / වැ

08. ශ්‍රී ලංකාවට තේ වගාව හඳුන්වා දෙනු ලැබුවේ හෙන්රි වික්හැම් විසිනි. නි / වැ

09. ඉන්දියාවේ බිහාර්, ඔරිස්සා ප්‍රාන්තවල යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථාන ස්ථානගත වීමට යපස් හා ගල් අඟුරු පිහිටා තිබීම බලපා ඇත. නි / වැ

10. ග්‍රැනයිට් හා බැසෝල්ට් විපරීත පාෂාණවලට නිදසුන් වේ. නි / වැ


11. සංවර්ධනය මැනීම සඳහා මානුෂ පීඩන දර්ශකය නූතන මිනුමක් ලෙස භාවිත කෙරේ. නි / වැ

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

12. ශ්‍රී ලංකාවේ මාංශ භෝග පර්යේෂණ ආයතනය පිහිටා ඇත්තේ ............................................ය.
13. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් වැඩි කොටසක් ............................... අංශයට අයත් වේ.
14. ඛනිජ සම්පත් වර්ගීකරණය අනුව ගල් අඟුරු ....................................ඛනිජ වර්ගයට අයත් වේ.
15. පිනිමුවා, පැන්ඩා සහ හිම වලසා .....................................වනාන්තර ප්‍රදේශවල දක්නට ලැබේ.
16. අයිජැෆ්ජල්ලා ජෝකුල් ගිනිකන්ද ............................................. හි පිහිටා ඇත.

- **අංක 16 සිට 19 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ශ්‍රී ලංකා සිතියම උපයෝගී කර ගන්න.**

ශ්‍රී ලංකාවේ පස් වර්ග ව්‍යාප්තිය පහත සිතියමේ දක්වා ඇත.




16. වියළි කලාපයට සීමා වූ රතු දුඹුරු පසෙහි ව්‍යාප්තිය අංක ................................ න් දැක්වේ.
17. තෙත් හා වියළි කලාප දෙකෙහි ම ව්‍යාප්ත ව ඇති අංක 6 න් දැක්වෙන්නේ ................................ පස යි.
18. රතු කහ පොඩ්සොල් පසෙහි ව්‍යාප්තිය දැක්වෙන්නේ අංක ........... න් ය.
19. චූර්ණමය නොවූ දුඹුරු පස ............................. ප්‍රදේශයේ ව්‍යාප්ත ව ඇත.

- **අංක 20 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට අනුව 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**20.**

| **'අ'**<br>**දූපත** | **'ආ'**<br>**පිහිටා ඇති මහාද්වීප තටකය** |
|---|---|
| 1- බෝර්නියෝ | A - ඕස්ට්‍රේලියා |
| 2- තස්මේනියා | B- ආසියා |
| 3- මැඩගස්කරය | C- අප්‍රිකා |
| | D- යුරෝපා |

(1) ABC (2) ACB (3) BAC (4) BCD (.......)

**21.**

| 'අ' | 'ආ' |
|---|---|
| **වගා කරන ප්‍රදේශය** | **දිස්ත්‍රික්කය** |
| 1- උඩරට තේ | A - රත්නපුර |
| 2- මැදරට තේ | B - මාතලේ |
| 3- පහතරට තේ | C - කුරුණෑගල |
| | D - නුවරඑළිය |

(1) ABC (2) BAC (3) DAC (4) DBA (…….)

**22.**

| 'අ' | 'ආ' |
|---|---|
| **ඛනිජ වර්ගය** | **ව්‍යාප්ති ප්‍රදේශය** |
| 1- මිනිරන් | A - රාගෙදර |
| 2- කෙඔලින් | B - දෙදියවෙල |
| 3- බෝල මැටි | C - බොරලැස්ගමුව |
| | D - පුල්මුඩේ |

(1) ABC (2) ACB (3) BCD (4) DAC (…….)

**23.**

| 'අ' | 'ආ' |
|---|---|
| **පිහිටි ප්‍රදේශය** | **වනජීවී රක්ෂිත වර්ග** |
| 1- වස්ගමුව | A - ස්වාභාවික රක්ෂිත |
| 2- හග්ගල | B - වන රක්ෂිත |
| 3- කන්නෙලිය | C - ජාතික උද්‍යාන |
| | D - දැඩි ස්වාභාවික රක්ෂිත |

(1)ABC (2) BCA (3) CDB (4) CBD (…….)

**24.**

| 'අ' | 'ආ' |
|---|---|
| **උපද්‍රව වර්ගය** | **උපද්‍රව වර්ගවලට නිදසුන්** |
| 1- භූ විද්‍යාත්මක උපද්‍රව | A - අකුණු සැර |
| 2- දේශගුණික උපද්‍රව | B - භූමිකම්පා |
| 3- ජීව විද්‍යාත්මක උපද්‍රව | C - වසංගත රෝග |
| | D - වන හායනය |

(1) ABC (2) BAC (3) CDA (4) DCB (…….)

- **අංක 25 සිට 36 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

25. ලෝකයේ කුඩා ම මහාද්වීපය කුමක් ද?
    (1) යුරෝපා (2) ඕස්ට්‍රේලියා
    (3) දකුණු ඇමරිකා (4) උතුරු ඇමරිකා (…….)

26. පෘථිවි ප්‍රාවරණය සහ හරය වෙන් කරන සීමාව දැක්වෙන අසන්තතිය මින් කුමක් ද?
    (1) ගුටෙන්බර්ග් (2) ලේමන්
    (3) මොහොරොවිසික් (4) කොන්රඩ් (.........)

27. මුල් කාලයේ නැව් තැනීමේ කර්මාන්තයට සංවර්ධිත රටවල් පමණක් යොමු වීමට හේතු වූ සාධකයක් වන්නේ කුමක් ද?
    (1) මිනිස් ශ්‍රමය බහුල ව තිබීම
    (2) විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කළ හැකි වීම
    (3) නො ගැඹුරු මුහුදු තටාකයක් තිබීම
    (4) කඩතොළු රහිත වෙරළ ප්‍රදේශ තිබීම (…….)

28. ශ්‍රී ලංකාවේ බලශක්ති පරිහරණයේ දී මතු වන ගැටලුවක් **නො වන්නේ,**
    (1) පුනර්ජනනීය බලශක්ති සඳහා අධික පිරිවැයක් වැය වීම
    (2) බලශක්ති පරිහරණයේ දී නාස්තිය හා අපතේ යාම වැඩි වීම
    (3) ග්‍රාමීය ප්‍රදේශවල කුඩා බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීම
    (4) ඛනිජ තෙල් ආනයනය සඳහා අධික මුදලක් වැය වීම (..........)

29. වර්ෂ 2012 සංගණනය අනුව දිවයිනේ සාමාන්‍ය ජන ඝනත්වය, වර්ග කිලෝමීටරයට
    (1) 323 (2) 345 (3) 352 (4) 520 (..........)

30. මාරවිල, මීගමුව, මොරටුව අයත් වන ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක කලාපය කුමක් ද?
    (1) බටහිර වෙරළබඩ ප්‍රදේශය (2) මහ කොළඹ කලාපය
    (3) දකුණු වෙරළබඩ ප්‍රදේශය (4) කොළඹ නගරය (..........)

31. A - ඇමසන්, කොංගෝ ප්‍රදේශය
    B - ඇමරිකාවේ ඊසානදිග වෙරළ කලාපය
    C - වයඹදිග යුරෝපය
    D - නයිල් ගංගා මෝය ආශ්‍රිත කලාපය
    E - ලයිබීරියාව, අයිවරි කෝස්ට් ප්‍රදේශය

    ඉහත දක්වා ඇති ජන සංකේන්ද්‍රණ කලාප අතරින් **ද්විතීයික** ජන සංකේන්ද්‍රණ දෙකක් දැක්වෙන්නේ,

    (1) A හා B (2) B හා C (3) C හා E (4) D හා E (..........)

32. ශ්‍රී ලංකා ජන සංඛ්‍යාවේ අඩු ම සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතිකයක් දක්නට ලැබෙන දිස්ත්‍රික්ක තුනක් වන්නේ,
    (1) කොළඹ, හම්බන්තොට, මොනරාගල
    (2) නුවරඑළිය, මොනරාගල, අනුරාධපුර
    (3) කොළඹ, බදුල්ල, නුවරඑළිය
    (4) අනුරාධපුර, මොනරාගල, හම්බන්තොට (..........)

33. තිරසර සංවර්ධනයෙහි මූලික අරමුණ වන්නේ,
    (1) මිනිසාගේ පැවැත්ම හා ජීවන රටාව උසස් කිරීම යි.
    (2) පරිසර කළමනාකරණය සහ සංවර්ධන කළමනාකරණය ඒකාබද්ධ කිරීම යි.
    (3) මිනිස් අවශ්‍යතා වැඩි වීම නිසා නිෂ්පාදන ක්‍රියාවලිය පුළුල් කිරීම යි.
    (4) කාර්මීකරණය නිසා ඇතිවන පාරිසරික විසංතුලනය වැළැක්වීම යි. (..........)

34. ලෝකයේ ළැව්ගිනි බහුල ව හටගන්නා රටවල්/කලාප තුනක් දැක්වෙන පිළිතුර තෝරන්න.
    (1) රුසියාව, ප්‍රංශය, ඉන්දුනීසියාව
    (2) චීනය, මධ්‍යම අප්‍රිකානු රටවල්, ඩෙන්මාර්කය
    (3) ඇමරිකා එක්සත් ජනපදය, චීනය, බ්‍රිතාන්‍යය
    (4) ඕස්ට්‍රේලියාව, ඇමරිකා එක්සත් ජනපදය, චීනය (..........)

35. අකුණු වර්ග අතුරින් ප්‍රජාවට බහුල ව ආපදා සිදු වන අකුණු සැර වර්ගය කුමක් ද?
    (1) වලා අකුණු (2) වායු අකුණු
    (3) භෞමීය අකුණු (4) විදුලි අකුණු (..........)

36. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම කෙරෙහි බලපාන හරිතාගාර වායු වර්ග දෙකක් ඇතුළත් වන පිළිතුර තෝරන්න.
    (1) මීතේන්, කාබන්ඩයොක්සයිඩ (2) ඔක්සිජන්, නයිට්‍රස් ඔක්සයිඩ්
    (3) ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන්, නයිට්‍රජන් (4) නයිට්‍රජන්, ඔක්සිජන් (..........)

- **පහත A, B, C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 37 සිට 40 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - 1. මරණ අනුපාතය
    2. ආයු අපේක්ෂාව

B - 1. සාක්ෂරතාව
    2. සංවර්ධනය

C - 1. න්‍යෂ්ටික අත්හදා බැලීම
    2. පරිසර දූෂණය

D - 1. උච්චත්වය
    2. උෂ්ණත්වය

37. පළමුවැන්නේ අඩු වීම දෙවැන්නේ වැඩි වීමට හේතු වන මාතෘකා යුගලය කුමක් ද ?
    (1) A (2) B (3) C (4) D (..........)

38. පළමුවැන්න වැඩි වීම දෙවැන්න ද වැඩි වීමට හේතු වන මාතෘකා යුගලය කුමක් ද ?
    (1) A (2) B (3) C (4) D (..........)

39. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ අඩු වීමට හේතු වන මාතෘකා යුගලය කුමක් ද ?
    (1) A (2) B (3) C (4) D (..........)

40. දෙවැන්නේ අඩු වීම කෙරෙහි පළමුවැන්නේ අඩු වීම හේතු වන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද ?
    (1) A (2) B (3) C (4) D (..........)

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**Ministry of Education, Sri Lanka**

| 61 | S | I, II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I, II |
| புவியியல் | I, II |
| Geography | I, II |

**භූගෝල විද්‍යාව II**

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
- ❖ I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.එහි (අ),(ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සඅපයිය යුතු ය.
- ❖ II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතුයි.
- ❖ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

## I කොටස

**1. (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.**

i. Ⓐ - Ⓑ රේඛාවෙන් දැක්වෙන්නේ කුමක් ද?

(නෙරුවකි / නිම්නයකි / දළ බෑවුමකි) (ලකුණු 01)

ii. Ⓒ අක්ෂරයෙන් දක්වා ඇති ලක්ෂණය කුමක් ද?

(ගල / වෙනත් වැවිලි / ලඳු කැලෑ) (ලකුණු 01)

iii. Ⓓ අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද?

(තණබිම / ලඳු කැලෑ / අතු ගංගාව) (ලකුණු 01)

iv. Ⓔ අක්ෂරයෙන් දැක්වෙන චතුරස්‍රාකාර ප්‍රදේශයේ ව්‍යාප්ත ව ඇති ප්‍රධාන ව්‍යාපාරික භෝගය කුමක් ද?

(රබර් / පොල් / වෙනත් වැවිලි) (ලකුණු 01)

v. ප්‍රදේශයේ බටහිර සිට නැගෙනහිර දෙසට විහිදෙන දුම්රිය මාර්ගය අයත් වන වර්ගය කුමක් ද ?

(පටු / පුළුල් ඒකීය / පුළුල් ද්විත්ව) (ලකුණු 01)

vi. Ⓕ අක්ෂරයෙන් දක්වා ඇති හැකි භූ ලක්ෂණය කුමක් ද ? (ලකුණු 01)




vii. Ⓧ සිට Ⓨ ලෙස නම් කර ඇති දුම්රියපොළ දෙක අතර දුර කිලෝමීටර් කීය ද ? (ලකුණු 01)

viii. Ⓟ අක්ෂරයෙන් දක්වා ඇති චතුරස්‍රාකාර ප්‍රදේශයෙහි ඇති පොදු සේවා සපයන ආයතන **දෙකක්** නම් කරන්න.

(ලකුණු 02)

ix. සිතියම් ප්‍රදේශය ඔස්සේ විහිදෙන පරිපාලන මායිම තීරණය කිරීමෙහි ලා බලපා ඇති භෞතික ලක්ෂණය කුමක් ද? (ලකුණු 01)

(ඇ)




SCALE : 1 : 50,000

**(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබද ව දක්වා ඇති තීරුව යොදා ගන්න.**

- **අංක (i) සිට (v) දක්වා එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, සිතියමට යාබද ව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.**

i. මකර නිවර්තනය - Ⓐ ,Ⓑ ,Ⓒ
ii. කපු වගාව සඳහා ප්‍රසිද්ධ ටෙක්සාස් ප්‍රදේශය - Ⓓ ,Ⓔ ,Ⓕ
iii. පිලිපීන දූපත්හි පිනාටුබෝ ගිනිකන්ද - Ⓖ ,Ⓗ ,Ⓘ
iv. ආසියාවේ වැඩි ම ජනසංඛ්‍යාවක් වාසය කරන ටෝකියෝ - Ⓙ ,Ⓚ ,Ⓛ
v. කලහාරි කාන්තාරය - Ⓜ ,Ⓝ ,Ⓞ (ලකුණු 05)

**(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබද ව දක්වා ඇති තීරුව යොදා ගන්න.**

- **අංක (i) සිට (v) දක්වා එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, සිතියමට යාබද ව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.**

i. කැනියොන් විදුලි බලාගාරය - Ⓐ ,Ⓑ ,Ⓒ
ii. ශ්‍රී ලංකාවේ වැඩි ම වර්ෂාපතනයක් ලැබෙන මාලිබොඩ - Ⓓ ,Ⓔ ,Ⓕ
iii. හිඟුරක්ගොඩ වී පර්යේෂණ ආයතනය - Ⓖ ,Ⓗ ,Ⓘ
iv. දෙවුන්දර තුඩුව - Ⓙ ,Ⓚ ,Ⓛ
v. පුල්මුඩේ ඛනිජ වැලි නිධිය - Ⓜ ,Ⓝ ,Ⓞ (ලකුණු 05)

භූගෝල විද්‍යාව II

1 (අ)

I. ------------------------------------------------------------------------------------------

II.------------------------------------------------------------------------------------------

III.------------------------------------------------------------------------------------------

IV. ------------------------------------------------------------------------------------------

V. ------------------------------------------------------------------------------------------

VI. ------------------------------------------------------------------------------------------

VII. ------------------------------------------------------------------------------------------


VIII. ------------------------------------------------------------------------------------------

IX. ------------------------------------------------------------------------------------------

X. ------------------------------------------------------------------------------------------


10

(ආ)




(i)
(ii)
(iii)
(iv)
(v)
5

(ඉ)





(i)
(ii)
(iii)
(iv)
(v)
5

1. (අ) $\frac{___}{10}$ + (ආ) $\frac{___}{05}$ + (ඉ) $\frac{___}{05}$ = $\frac{___}{20}$

## II කොටස

**2.** ශිලාගෝලයේ ප්‍රධාන භූ තැටි දැක්වෙන ලෝක ආකෘති සිතියමක් පහත දැක්වේ.




(i) සිතියමේ A හා B අක්ෂරවලින් දැක්වෙන භූ තැටි අනුපිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

(ii) ශිලාගෝලයෙහි ඇති සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ දී එයට ඇති වන බලපෑම් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ජෛවගෝලයෙහි සමතුලිත බව ආරක්ෂා කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** නම් කර ඉන් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

**3.** (i) පහත දැක්වෙන ශ්‍රී ලංකාවේ බෝග සම්බන්ධ පර්යේෂණ මධ්‍යස්ථානය බැගින් නම් කරන්න.

A - රබර් B - පොල් (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ රබර් සහ පොල් වගාවට පොදු වූ ගැටලු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) කෘෂිකාර්මික බෝග වගා ආශ්‍රිත ගැටලු විසඳා ගැනීමට අනුගමනය කළ හැකි විසඳුම් **තුනක්** දක්වා ඉන් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

**4.** (i) ලෝකයේ විද්‍යුත් උපකරණ නිෂ්පාදනයේ ප්‍රමුඛ නැගෙනහිර ආසියානු රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(ii) ලෝකයේ විද්‍යුත් කර්මාන්තයේ නව ප්‍රවණතා **තුනක්** ලියන්න. (ලකුණු 03)

(iii) (a) විද්‍යුත් කර්මාන්තය ආශ්‍රිත ව ඇති වන පාරිසරික ගැටලු **දෙකක්** සඳහන් කරන්න.

(b) එම ගැටලු විසඳීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් යෝජනා කර එය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

**5.** (i) ලෝහමය ඛනිජ සඳහා උදාහරණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(ii) ඛනිජ සම්පත් භාවිතයේ දී මුහුණපාන ගැටලු **තුනක්** ලියන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් සංරක්ෂණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග **දෙකක්** ලියන්න.

(b) ශ්‍රී ලංකාවේ ඇති ඛනිජ සම්පත් ආර්ථික සංවර්ධනය සඳහා දායක කර ගත හැකි ආකාරය උදාහරණයක් ඇසුරින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

**6.** (i) (a) දකුණු ආසියාවේ ජන ඝනත්වය අධිකතම රට නම් කරන්න.

(b) දකුණු ආසියාවේ සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය ඉහළ ම රට කුමක් ද ? (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය පහළ අගයක් ගැනීමට හේතු වන කරුණු **තුනක්** දක්වන්න. (ලකුණු 03)

(iii) ලෝක ජනසංඛ්‍යා වර්ධනය නිසා ඇති වන ගැටලු **දෙකක්** සඳහන් කර, ඒවා අවම කර ගැනීමට ගත හැකි විසඳුමක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

**7.** (i) ශ්‍රී ලංකාවේ භාවිත වන ප්‍රමුඛ බලශක්ති ප්‍රභව **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(ii) බලශක්ති පරිහරණයේ දී මතු වන ගැටලු **තුනක්** දක්වන්න (ලකුණු 03)

(iii) බලශක්ති සම්පත් සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** දක්වා ඉන් **එකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

**8.** (i) පහත දැක්වෙන ආපදාවන්ට ශ්‍රී ලංකාවේ බහුල ව ගොදුරු වන දිස්ත්‍රික්ක **එක** බැගින් නම් කරන්න.

(a) නායයෑම් (b) ජලගැලීම් (ලකුණු 02)

(ii) නියඟ ආපදාව නිසා,

(a) මානුෂ පරිසරයට සිදු වන බලපෑම් **එකක්** ද,

(b) භෞතික පරිසරයට සිදු වන බලපෑම් **දෙකක්** ද සඳහන් කරන්න.

(ලකුණු 03)

(iii) නායයෑම් ආපදාව නිසා මානුෂ පරිසරයට සිදු වන බලපෑම් **තුනක්** සඳහන් කර එම බලපෑම් අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 05)

*****